OL/2023(2024)/62/Q/S- I, II

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2023(2024)

අනුහුරු ප්‍රශ්න පත්‍රය
**Model Paper**
மாதிரி வினாத்தாள்

# පුරවැසි අධ්‍යාපනය

# குடியியற் கல்வி

# CIVIC EDUCATION



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 62 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - மாதிரி வினாத்தாள் - 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination - Model Paper 2023(2024)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civics Education I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයයි". මෙම ප්‍රකාශය හා සම්බන්ධ චින්තකයා වන්නේ,

   (1) සීලර් ය. (2) ඒබ්‍රහම් ලින්කන් ය. (3) ජේ.ආර්. ලවෙල් ය. (4) ඇරිස්ටෝටල් ය.

2. ග්‍රීක යුගයේ ක්‍රියාත්මක වූ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය තුළ පැවති ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?

   (1) ආණ්ඩු බලය විභේදනය කර නොතිබීම (2) නගරවැසි ස්ත්‍රීන්ට ඡන්ද බලය හිමිවීම
   (3) දේශපාලන බලය පාලකයින්ට පමණක් හිමිවීම (4) දේශපාලන තීරණවලට සියලුදෙනාම සහභාගී වීම

3. ඡන්ද කොට්ඨාස බෙදා වෙන්කිරීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන නිර්ණායක දෙක වන්නේ,

   (1) ආර්ථිකය හා සංස්කෘතිය (2) ජනගහනය හා ජන වර්ගය
   (3) භූමිය හා සංස්කෘතිය (4) භූමිය හා ජනගහනය

4. ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත්වීම කෙරෙහි විප්ලවීය වෙනසක් ඇති කළ ක්ෂේත්‍රය වන්නේ,

   (1) විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවයි. (2) ජනගහන වර්ධනයයි.
   (3) අන්තර්ජාතික වෙළෙඳාමයි. (4) ආර්ථික සංවර්ධනයයි.

5. සදාචාරාත්මක යුතුකමක් වන්නේ,

   (1) වැඩිහිටියන්ට සැලකීමයි. (2) අය බදු ගෙවීමයි.
   (3) නීති පිළිපැදීමයි. (4) පොදු දේපළ ආරක්ෂා කිරීමයි.

6. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව,

   (1) 25 කි. (2) 22 කි. (3) 21 කි. (4) 23 කි.

7. අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා,

(1) නීතිපති ය. (2) අධිකරණ ඇමති ය. (3) අගවිනිසුරු ය. (4) ඔම්බුඩ්ස්මන් ය.

8. "ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුවක්" හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

(1) කෲව් මැකලම් (2) ඩොනමෝර් (3) සෝල්බරි (4) කෝල්බෲක්

9. සංවර්ධනය මැනීමේ සාම්ප්‍රදායික මිනුමක් වන්නේ,

(1) භෞතික ජීවන තත්ත්ව දර්ශකයයි. (2) දළ ජාතික නිෂ්පාදිතයයි.
(3) මානව සංවර්ධන දර්ශකයයි. (4) දුරකථන ඝනත්වයයි.

10. දෙවන ලෝක යුද්ධයෙන් ඇති වූ බිහිසුණු තත්ත්වය වැනි තත්ත්වයක් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා 1945 වර්ෂයේ දී පිහිටුවා ගත් ජාත්‍යන්තර සංවිධානය කුමක්ද?

(1) ආසියාන් (2) එක්සත් ජාතීන්ගේ (3) නේටෝ (4) වර්සෝ

11. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත වන ප්‍රබල මුදල් ඒකකයක් වන්නේ,

(1) පාකිස්ථානු රුපියල් ය. (2) කුවේට් ඩිනාර් ය. (3) ඇමරිකානු ඩොලර් ය. (4) ඉන්දියානු රුපියල් ය.

12. ලාංකිකයන්ට සීමිත ඡන්ද බලය හා සර්වජන ඡන්ද බලය ලබා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ **දෙක** පිළිවෙළින් තෝරන්න.

(1) කෝල්බෲක් සහ කෲව් මැකලම් (2) කෲව් මැකලම් සහ ඩොනමෝර්
(3) සෝල්බරි සහ ඩොනමෝර් (4) මැනිං සහ මැනිං ඩෙවොන්ෂයර්

13. නියෝජිතයන් තෝරාපත් කරගැනීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රමය වන්නේ,

(1) 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය (2) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය
(3) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය (4) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය

14. අනුරාධපුර යුගයේ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනය සඳහා "ගම්භාර", "ගාමණී" වැනි නිලධාරීන් පත්කිරීම,

(1) බලය මධ්‍යගත කිරීමකි. (2) බලය බෙදා හැරීමකි. (3) බලය විමධ්‍යගත කිරීමකි. (4) බලය ඒකරාශී කිරීමකි.

15. සන්ධීය රාජ්‍යයන් පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ස්විට්සර්ලන්තය
(2) ඉන්දියාව, පාකිස්ථානය, ස්විට්සර්ලන්තය
(3) ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, පාකිස්ථානය
(4) ඉන්දියාව, ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍යය

16. ශ්‍රී ලංකාවේ පළාත් සභා සඳහා ආණ්ඩුකාරවරු පත්කරනු ලබන්නේ කවුරුන් විසින්ද?,

(1) මහ ඇමති (2) අගවිනිසුරු (3) අගමැති (4) ජනාධිපති

17. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මකවීමෙන් අත්වන ප්‍රතිඵලයක් **නොවන්නේ,**

(1) අයිතිවාසිකම් තහවුරු වීම ය. (2) විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලැබීම ය.
(3) ආගමික භේද වර්ධනය වීම ය. (4) ජනවර්ග අතර විශ්වාසය තහවුරුවීම ය.

18. අපරාධ නීතිය යටතේ දඬුවම් හිමිවන වැරදි ක්‍රියාවකි;

(1) දික්කසාද (2) ඉඩම් ගැටලු (3) මිනීමැරුම් (4) ගිවිසුම් උල්ලංඝනය කිරීම්

19. සිවිල් හා දේශපාලන අයිතිවාසිකමක් වන්නේ,

(1) පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය (2) සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
(3) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය (4) නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය

20. වායු දූෂණයට බලපාන ස්වභාවික හේතුවක් **නොවන්නේ** මින් කුමක්ද?

(1) ගිනි කඳු පිපිරීම් (2) කැළි කසල (3) දූවිලි කුණාටු (4) ලැව්ගිනි

21. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පිහිටුවා ඇති දුරකථන සේවාවේ අංකය මින් කුමක්ද?

(1) 1918 (2) 1929 (3) 1919 (4) 1990

22. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක වීමට අවශ්‍ය සාධකයකි.

(1) ජන සමාජයක් තුළ විවිධත්වයක් පැවතීම
(2) නිර්භීත සහ එඩිතර නායකත්වයක් පැවතීම
(3) වෙනස් නොවන දේශපාලන ප්‍රතිපත්තියක් පැවතීම
(4) දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම

23. ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵලයක් **නොවන්නේ** මින් කුමක්ද?

(1) ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වීම (2) කුලී හේවායන් බඳවා ගැනීම
(3) නව රැකියා අවස්ථා උදාවීම (4) නව තාක්ෂණික දැනුම හුවමාරු කරගැනීම

24. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන වෙනස්කමක් වන්නේ,

(1) සුළු ජාතීන්ට අයිතිවාසිකම් හිමිකරදීම (2) සීමිත ඡන්ද බලය හඳුන්වාදීම
(3) සර්ව ජන ඡන්ද බලය හඳුන්වාදීම (4) පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම

25. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිෂේධ බලය හිමි නිත්‍ය සාමාජික රටක් වන්නේ,

(1) ජපානය (2) ඉන්දියාව (3) චීනය (4) ශ්‍රී ලංකාව

26. දකුණු ආසියානු උප භූගෝලීය කලාපයට අයත් රටවල් විසින් පිහිටුවාගත් සංවිධානය වන්නේ,

(1) සාර්ක් (2) ආසියාන් (3) කොළඹ ක්‍රමය (4) බිම්ස්ටෙක්

27. රටක සංවර්ධනය මැනීම සඳහා භාවිත කරනු ලබන මානව සංවර්ධන දර්ශකයේ සංරචක **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) උපතේදී ආයු අපේක්ෂාව, සාක්ෂරතාව, ක්‍රය ශක්තිය
(2) උපතේ දී ආයු අපේක්ෂාව, අධ්‍යාපනය, ක්‍රය ශක්තිය
(3) උපතේදී ආයු අපේක්ෂාව, සාක්ෂරතාව, ළදරු මරණ අනුපාතිකය
(4) උපතේ දී ආයු අපේක්ෂාව, ක්‍රය ශක්තිය, දළ ජාතික නිෂ්පාදිතය

28. දේපළවල අයිතිය රාජ්‍ය අංශය සතු වන අර්ථ ක්‍රමය වන්නේ,

(1) ධනවාදී (2) සමාජවාදී (3) වෙළෙඳපොළ (4) මිශ්‍ර

29. ආසියාවේ පිහිටි සංවර්ධිත රාජ්‍යයකි;

(1) ශ්‍රී ලංකාව (2) චීනය (3) ඉන්දියාව (4) ජපානය

30. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පරමාධිපත්‍යය බලය පවතින්නේ,

(1) විධායකයට ය. (2) මහජනතාවට ය.
(3) පාර්ලිමේන්තුවට ය. (4) අධිකරණයට ය.

31. මෑත කාලීනව යුධමය ගැටුමකට සම්බන්ධ වූ රාජ්‍යයන් දෙකකි;

(1) සිංගප්පූරුව හා මැලේසියාව (2) චීනය සහ චීන තායිපේ
(3) ඊශ්‍රායලය හා පලස්තීනය (4) උතුරු කොරියාව හා දකුණු කොරියාව

32. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පුරවැසියාගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩ වූ විට එය ආරක්ෂා කිරීමට පත්කළ නිලධාරියා වන්නේ,

(1) සොලිසිටර් ජනරාල්වරයා
(2) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා
(3) අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා
(4) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා

33. 1980 සම්මත කරන ලද ජාතික පාරිසරික පනත මගින් ආවරණය වන ඕනෑම ගැටලුවකදී ඒ පිළිබඳව කටයුතු කරනු ලබන ආයතනය වන්නේ,

(1) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි.
(2) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියයි.
(3) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයයි.
(4) මධ්‍යම පරිසර අධිකාරියයි.

34. ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස වැදගත්වීමට බලපාන කරුණු **පමණක්** ඇතුළත් පිළිතුරු කාණ්ඩය,

(1) අන්‍ය මත ගරු කිරීම, අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඇගයීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම
(2) අන්‍ය මත ගරු කිරීම, සමානාත්මතාව ගරු කිරීම, සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
(3) ඡන්ද බලය පැවතීම, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම, මහජන කැමැත්ත මත සිදුවීම
(4) අයිතිවාසිකම් හා යුතුකම් ඇගයීම, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම, සාකච්ඡා මගින් තීරණවලට එළඹීම

35. ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් වන්නේ,

(1) නීති මාලාවට අනුව විසඳුම් කරා යොමුවීම ය.
(2) අවිධිමත් ව්‍යුහයකින් යුක්තවීම ය.
(3) වියදම අධික ක්‍රමයක් වීම ය.
(4) එක් පක්ෂයකට පමණක් ජය ලැබීම ය.

36. තිරසර සංවර්ධනය ළඟාකර ගැනීම සඳහා යොදාගනු ලබන "3R" සංකල්පයේ සංරචක වන්නේ,

(1) අවම කිරීම, සුපිරිසිදු නිෂ්පාදනය, වැරදි ශූන්‍ය කිරීම
(2) නැවත භාවිතය, හරිත ඵලදායීතාව, ප්‍රතිචක්‍රීකරණය
(3) වැරදි ශූන්‍ය කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය
(4) අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය

37. පරිසරය සම්බන්ධයෙන් පුරවැසියෙකු සතු යුතුකමක් වන්නේ,

(1) පරිභෝජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් භාවිත කිරීමයි.
(2) තම අභිමතය පරිදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමයි.
(3) පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීමයි.
(4) සිය අවශ්‍යතා හා වුවමනා වැඩිකර ගැනීමයි.

38. පරිසරයෙන් ලැබෙන සේවා අතර ආර්ථික උපකාරක සේවා **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ජල විදුලිය, සුළං බලය, ජලය
(2) භූමිය, හිරු එළිය, භූ තාපය
(3) හිරු එළිය, වාතය, දැව
(4) භූමිය, ඛනිජ සම්පත්, දැව

39. පහත සඳහන් A සහ B ප්‍රකාශ සලකා බලන්න.

A- ස්වභාවික සජීවී පරිසරය විනාශ කිරීමට බලපාන සියලු ආකාරයේ විනාශකාරී තත්ත්ව **"පාරිසරික ගැටලු"** ලෙස පෙන්වා දිය හැකි ය.
B- පාරිසරික ගැටලුවලට ස්වභාවික ක්‍රියා සහ මිනිස් ක්‍රියා හේතු වේ. මෙම ප්‍රකාශ අතුරින්,

(1) A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි.
(2) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.
(3) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
(4) A හා B ප්‍රකාශ අසත්‍ය වේ.

40. ලොව බලවත් රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකා රාජ්‍යයට බලපෑම් එල්ල කරන ක්ෂේත්‍රය A තීරුවේ ද, එහි බලපෑම B තීරුවේ ද දැක්වේ. A තීරුව හා B තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| **(A) බලපෑම් එල්ල කරන ලද ක්ෂේත්‍රය** | **(B ) බලපෑම** |
|---|---|
| 1. ජාත්‍යන්තර වෙළඳාම | A. ප්‍රාථමික නිෂ්පාදනවලට අඩු මිලක් ලබාදීම |
| 2. ණය හා ආධාර | B. ඛනිජ තෙල් මිල ඉහළ යාම |
| 3. ආර්ථික ක්ෂේත්‍රය | C. විවිධ කොන්දේසි පැනවීම |
| 4. ජාතික ආරක්ෂාව | D. ශ්‍රී ලංකා රජය වෙත ඉහළ මිලක් යටතේ අවි අලෙවිය |

(1) ACBD (2) ACDB (3) BACD (4) CDAB

**

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 62 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය- 2023 (2024)
கல்விப் பொதுத் தராதரம் பத்திர (சாதாரண தர)ப் பரீட்சை - மாதிரி வினாத்தாள் - 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination - Model Paper 2023(2024)

පුරවැසි අධ්‍යාපනය **I, II**
குடியியற் கல்வி I, II
Civic Education I, II

**පුරවැසි අධ්‍යාපනය II**

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1.

I. ආණ්ඩුවේ ප්‍රධාන අවයව **දෙකක්** නම් කරන්න.
II. ඒකීය රාජ්‍යයක ලක්ෂණ **දෙකක්** ලියන්න.
III. ස්විට්සර්ලන්තයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන **නාමයන්** පිළිවෙළින් දක්වන්න.
IV. මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** නම් කරන්න.
V. ගැටුම් ඇතිවීමට බලපාන දේශපාලන මූල **දෙකක්** ලියන්න.
VI. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ යෝජනා **දෙකක්** නම් කරන්න.
VII. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය පිහිටුවීමට පදනම් කරගත් නීතිමය මූලාශ්‍ර **දෙක** කුමක්ද?
VIII. මානව අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා **දෙකක්** ලියන්න.
IX. ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල **දෙකක්** දක්වන්න.
X. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න.

(ලකුණු 02×10 = 20 යි)

2. බොහෝ රාජ්‍යයන් තම රටේ පාලන කටයුතු සඳහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යොදාගනී.

I. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය නූතනයේ ක්‍රියාත්මක නොවීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02 යි)
II. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත්වීම කෙරෙහි බලපා ඇති කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
III. (a)නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(b) ඉහත (a) හි ඔබ සඳහන් කළ එක් ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

3. වර්තමාන ලෝකයේ බොහෝ රටවල පවතින්නේ බහු සංස්කෘතික ජන සමාජයන් ය.

I. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් පවතින රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
II. සමාජ සාධාරණත්වය බිඳවැටීම කෙරෙහි බලපාන හේතු සාධක **තුනක්** දක්වන්න.(ලකුණු 03 යි)
III. (a) බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(b) ඉහත (a) හි ඔබ සඳහන් කළ **එක්** ප්‍රයෝජනයක් සමාජයේ යහපතට හේතුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

4. සමූහයක් ලෙස ජීවත් වීමේ දී මිනිසාට විවිධ අවශ්‍යතාවන් හා වුවමනාවන් ඇති වේ.

I. පහත සඳහන් මූලික අවශ්‍යතා දෙක හා බැඳුණු වුවමනාවන් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

අ) ආහාර

ආ) නිවාස

II. මිශ්‍ර ආර්ථික ක්‍රමයක දැකිය හැකි ලක්ෂණ **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)

III. (a) ගෝලීයකරණය විසින් ශ්‍රී ලංකා ආර්ථිකයට කරන ධනාත්මක බලපෑම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ඉහත (a) හි ඔබ සඳහන් කළ එක් බලපෑමක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

5. ගැටුම් මගින් බොහෝ විට ඇතිවන්නේ විනාශකාරී ප්‍රතිඵල ය.

I. ප්‍රධාන ගැටුම් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

II. ගැටුම්වල විනාශකාරී ප්‍රතිඵල **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

III. (a) ගැටුම් නිරාකරණය සඳහා යොදාගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ඉහත (a) හි සඳහන් කළ එක් ගැටුම් නිරාකරණ ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

6. ඕනෑ ම රටක යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියක් පිහිටුවා ඇත.

I. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර **දෙකක් ලියන්න.** (ලකුණු 02 යි)

II. ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළ ම තලයේ කටයුතු කරන ප්‍රධාන භූමිකා **ත්‍රිත්වය** නම් කරන්න. (ලකුණු 03 යි)

III. (a) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට අමතරව පවතින ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ඉහත (a) හි සඳහන් කළ එක් විකල්ප ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

7. සෑම මිනිසෙකුට ම ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් උරුම විය යුතු ය.

I. වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

II. ළමා අයිතිවාසිකම් සම්මුතිය සඳහා පදනම් කරගත් මූලධර්ම **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

III. (a) කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ඉහත (a) හි සඳහන් කළ එක් ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

***

OL/2023(2024)/62/A/S- I, II

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2023(2024)

# අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය
# மாதிரி வினாத்தாளுக்கான விடைப்பத்திரம்
# Answer Sheet for the Model Paper

# පුරවැසි අධ්‍යාපනය

# குடியியற் கல்வி

# CIVIC EDUCATION



**Answer Sheet – I, II | පිළිතුරු පත්‍රය I, II (සිංහල මාධ්‍යය)**

**අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**

**පුරවැසි අධ්‍යාපනය - 1 (පිළිතුරු පත්‍රය)**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 1 | 11 | 3 | 21 | 2 | 31 | 3 |
| 02 | 1 | 12 | 2 | 22 | 4 | 32 | 4 |
| 03 | 4 | 13 | 4 | 23 | 2 | 33 | 4 |
| 04 | 1 | 14 | 3 | 24 | 1 | 34 | 2 |
| 05 | 1 | 15 | 1 | 25 | 3 | 35 | 2 |
| 06 | 2 | 16 | 4 | 26 | 1 | 36 | 4 |
| 07 | 3 | 17 | 3 | 27 | 3 | 37 | 3 |
| 08 | 3 | 18 | 3 | 28 | 2 | 38 | 4 |
| 09 | 2 | 19 | 4 | 29 | 4 | 39 | 1 |
| 10 | 2 | 20 | 2 | 30 | 2 | 40 | 1 |

**පුරවැසි අධ්‍යාපනය - 11 (පිළිතුරු පත්‍රය)**

(1)
(i)

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

**(මින් ඕනෑම අංග දෙකක්)**

(ii)

- ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම
- මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන කටයුතු පහසු කරගැනීමේ අරමුණු සහිතව එකී පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකක වෙත විමධ්‍යගත කිරීම
- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරගත් පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම
- මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කරන ලද එම පරිපාලන බලතල නැවත පවරා ගත හැකි වීම

**(මින් ඕනෑම ලක්ෂණ දෙකක්)**

(iii)

- කැන්ටන්
- ප්‍රාන්ත

(iv)

- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ, කවුරුන් නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

**(මින් ඕනෑම ප්‍රශ්න දෙකක්)**

(v)

- දේශ සීමා
- බල ව්‍යාප්තිය
- දේශපාලන මතය

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

(vi)

- සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
- රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
- විධායක කාරකසභා ක්‍රමය
- පළාත්බද නියෝජනය හඳුන්වාදීම **(මින් ඕනෑම යෝජනා දෙකක්)**

(vii)

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය
- 1987 අංක 42 දරණ පළාත් සභා පිළිබඳ පාර්ලිමේන්තු පනත

(viii)

- මැග්නා කාර්ටා ගිවිසුම
- බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
- මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- රුසියානු විප්ලවය **(මින් ඕනෑම අවස්ථා දෙකක්)**

(ix)

- ජෛව පරිසර තුලිතතාව බිඳ වැටීම
- ආවේණික ශාක හා සත්ත්ව ප්‍රජාව විනාශ වීම
- ජෛව පද්ධතිවල ක්‍රියාකාරීත්වය බිඳ වැටීම
- ආහාර දාම හා ආහාර ජාල බිඳ වැටීම
- ආක්‍රමණශීලී ශාක හා සත්ත්ව ප්‍රජා බිහිවීම **(මින් ඕනෑම ප්‍රතිඵල දෙකක්)**

(x)

- රාජ්‍ය උපාය සම්බන්ධතා
- යුධ උපාය සම්බන්ධතා

2.

I.

- වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
- අධික ජනගහනය
- සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුතාව
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම
- මිනිස් අභිලාෂ සංකීර්ණවීම **(මින් ඕනෑම කරුණු දෙකක්)**

II.

- මහජන කැමැත්ත මත සිදුවන නිසා (පාලනය සඳහා නියෝජිතයින් තෝරා ගන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුවය.)
- ආණ්ඩු බලය හිමිවන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත්වූ පක්ෂයට හෝ කණ්ඩායමට වීම.
- නීති සම්පාදනය කරනු ලබන්නේ ද මහජන ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයින්ගේ බහුතර කැමැත්ත අනුව වීම.

III. a.

- නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්ද දායකත්වය/ ඡන්ද අපේක්ෂකත්වය ලැබීමේ අයිතිය තහවුරු වී තිබීම.
- නිදහසේ මැතිවරණ කටයුතුවලට සහභාගී වීමට ඇති අයිතිය තහවුරු වී තිබීම.
- මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම
- සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම **(මින් ඕනෑම කරුණු දෙකක්)**

b. ඉහත එක් කරුණක් විස්තර කළ යුතුය.

3.

I.

- ඇමරිකා එක්සත් ජනපදය
- ඉන්දියාව

II.

- අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම
- රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව
- රාජ්‍ය සේවය දේශපාලනීකරණයවීම
- නිලධාරිවාදය
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය නොමැති වීම
- අල්ලස හා දූෂණය ඉහළ යාම
- රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම
- පෞද්ගලික අංශය ජාතික අභිලාෂ නොසලකා හැරීම **(මින් ඕනෑම කරුණු තුනක්)**

III. a.

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වීම.
- අන්‍යොන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වීම.
- එක් ජාතියක්-එක් රටක් යන හැඟීම වර්ධනය වීම.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීම.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකු ම නොපිරිහෙලා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙළඹීම.
- අන්‍ය ආගම් හෝ සංස්කෘතීන්ට අගරු නොවන ආකාරයට හැසිරීමට හුරුවීම.

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

b. ඉහත එක් කරුණක් විස්තර කළ යුතුය.

4.

I.

- ආහාර - බත්, පාන්, පිට්ටු, රොටී, ................ ආදී වශයෙන්
- නිවාස - පැල්පත්, මැටි ගෙවල්, තට්ටු නිවාස, ................ ආදී වශයෙන්

II.

- නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශය ම සතුවීම
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශය ම ක්‍රියා කිරීම
- වෙළෙඳපොළ මත භාණ්ඩවල මිල තීරණය වුව ද රජය ඒ සඳහා මැදිහත් වීම
- පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙක ම නිෂ්පාදන කාර්යයට දායකවීම
- පොදු යහපත සඳහා සුබසාධන කටයුතු කිරීමට රජය මැදිහත් වීම

**(මින් ඕනෑම කරුණු තුනක්)**

III. a.

- විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
- වැඩලෝකය තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වීම නිසා සේවා වියුක්තිය අඩුවීම
- දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇතිවීම
- කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම
- ජාත්‍යන්තර වෙළෙඳපොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම
- ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් වීම
- ආර්ථික විවිධාංගීකරණය වීම
- ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන බිහිවීම
- විදේශීය විශේෂඥ දැනුම මෙරටට ගලා ඒම නිසා දේශීය මානව සම්පත දියුණුවීම
- නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල්වීම
- දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකිවීම
- මහා පරිමාණ කර්මාන්ත නගරයෙන් බැහැර ව ස්ථානගතවීම නිසා ප්‍රාදේශීය සංවර්ධනයක් ඇතිවීම
- විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමට හැකිවීම

- අකාර්යක්ෂම කර්මාන්ත වෙළෙඳපොළෙන් ඉවත්වීම
- දේශීය පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු භාණ්ඩ ලබාගැනීමට අවස්ථා ලැබීම

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

b. ඉහත එක් කරුණක් විස්තර කළ යුතුය.

5.

I.

- අභ්‍යන්තර ගැටුම්
- බාහිර ගැටුම්

II.

- ජීවිත හානි සිදුවීම
- දේපළ හානි සිදුවීම
- සම්පත් නාස්තිවීම
- මානසික ආතතිය වැඩිවීම
- අයිතිවාසිකම් කඩවීම
- බෙදීම් වර්ධනයවීම
- දේශපාලනය අස්ථාවරවීම
- ආර්ථික පරිහානිය
- වෛරය, ක්‍රෝධය වැඩිවීම
- ජාතික සමගිය බිඳවැටීම, .................... ආදී වශයෙන්

**(මෙවැනි ගැළපෙන කරුණු තුනක්)**

III. a.

- සාකච්ඡා කිරීම
- සහමන්ත්‍රණය හා කේවල් කිරීම
- මැදිහත්කරණය
- සමථකරණය
- බේරුම් කිරීම
- විනිසීම
- උපදේශනය **(මින් ඕනෑම ක්‍රම දෙකක්)**

b. ඉහත එක් ගැටුම් නිරාකරණ ක්‍රමයක් විස්තර කළ යුතුය.

6.

I.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා තිබීම
- අධිකරණ සේවා කොමිසම පිහිටුවීම
- විනිසුරුවන් පත් කරන ආකාරය
- විනිසුරුවන් ඉවත් කරන ආකාරය
- සේවයේ සුරක්ෂිතතාව
- විනිසුරුවන්ගේ වැටුප් ගෙවීම,...... ආදී වශයෙන් **(මින් ඕනෑම කරුණු දෙකක්)**

II.

- අධිකරණ අමාත්‍යතුමා
- නීතිපතිතුමා
- අගවිනිසුරුතුමා

III.

a.

- බේරුම්කරණය
- ඔම්බුඩ්ස්මන්වරයා
- මානව හිමිකම් කොමිසම **(මින් ඕනෑම පිළිතුරු දෙකක්)**

b. ඉහත එක් කරුණක් විස්තර කළ යුතුය.

7.

I.

- සෑම පුද්ගලයෙකුට ම සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස හා ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.
- වධ හිංසාවලට හෝ කෲර අමානුෂික, අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.
- නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.
- කිසි ම පුද්ගලයෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී - පුරුෂභාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කිසිඳු හේතුවක් මත වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය.
- කිසිම පුද්ගලයෙකු අත්තනෝමතිකව සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. අතීතයට බලපාන පරිදි දණ්ඩ නීති පැනවීම නොකළ යුත්තේ ය.
- භාෂණයේ නිදහස, නීත්‍යානුකූල රැකියාවක් කිරීමේ නිදහස, සමානාත්මතාවයේ නිදහස, රට තුළ යාම් - ඊම් නිදහස, ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ නිදහස
- වෘත්තීය සමිති පිහිටුවීමේ සහ ඒවාට බැඳීමේ නිදහස
- අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහස

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

II.

- ළමයාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය
- සහභාගීත්වය පිළිබඳ මූලධර්මය
- වෙනස් කොට නොසැලකීම පිළිබඳ මූලධර්මය
- පැවැත්ම සහ සංවර්ධනය පිළිබඳ මූලධර්මය **(මින් ඕනෑම මූලධර්ම තුනක්)**

III. a.

- කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම
- කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම
- ජාතික කාන්තා කමිටුව පිහිටුවීම
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම
- සෑම පොලිස් ස්ථානයක ම කාන්තා අංශයක් පිහිටුවා තිබීම **(මින් ඕනෑම ක්‍රියාමාර්ග දෙකක්)**

b. ඉහත එක් ක්‍රියාමාර්ගයක් විස්තර කළ යුතුය.